අසීරුතා කියලා දෙයක් මට දැනෙන්නේ නැහැ.

මම ලිවීම ආරම්භ කළේ බිරිඳක්, ගෘහණියක්, මවක් කියන ඔය කාරණා තුනෙන්ම පස්සේ. ලංකාවේත් ඉන් පිටතත් කාලයක් ගත කළ පසුයි. ඒක යම් දුරකට වාසියක්. මොකද ඒ අත්දැකීම් එක්ක වෙනදාට වඩා ලෝකයට විවෘත වුණු මනසකින් ලෝකය දකින්න පහසු වුණු නිසා. මම හිතන්නේ නවකතාවක ප්‍රස්තූතය සොයාගෙන යන්න ලොකුම උදව්ව වන්නේ මගේ වටපිටාවේ තියෙන කලබලය. අදටත් මට මගේ ජීවිතයේ තියෙන කාර්යබහුලත්වය අභියෝගයක් නෙමෙයි, සහයෝගයක් මිසක්. මම ලිවීම තුලින් කරන්නේ කතාවේ චරිතවල ආත්ම කතා කරන්නට සැලැස්වීම. ගැඹුරු ආඛ්‍යානයක් පවත්වාගෙන යන එක. එතැනදී නිදහසේ සැරිසරන චරිතයකට ආවේශවීමයි කළ යුත්තේ.
වාසනාවට එයට මට වටපිටාවේ තියෙන සියල්ල උදව්වක් කර ගන්නට පුළුවනි. හුදෙකලාව වගේම කලබලය.

මේ මවක්, බිරිඳක් කියන භූමිකාවේ තියෙන නොසන්සුන්කම තුළ ගොඩනැගෙන සිදුවීම් තුළම, මොහොතකට අහඹු ලෙස මුණ ගැසෙන පුද්ගලයින් කියන කතා තුළින්ම තමයි මගේ නිර්මාණ ගොඩනැගිලා තියෙන්නේ.

**නිර්මාණයක ආකෘතිය ගැන ඔබ දරන මතය කුමක්ද?**

ආකෘතිය ගැන නම් මම කවදාවත් හිතලා නැහැ. එය මම උවමනාවෙන් ගොඩ නගන දෙයක් නෙමෙයි. මගේ එකම අරමුණ පොතේ තේමාව. එකිනෙකට වෙස් තේමාවන් ඔස්සේ ලිවීම තමයි මගේ උත්සාහය. එලෙස ලියාගෙන යද්දී ඒ කතාවට අනන්‍ය ආකෘතිය නොහිතාම ඉදිරියට එනවා. මම සාහිත්‍ය ගැන හදාරලා නවකතා ලිවීමට ආව කෙනෙක් නෙමෙයි. මම දිගටම මගේ පුරුද්දට ජීවිත අත්දැකීම් ලියන කෙනෙක්. මේක මට මහා ලොකු අවාසියක් වෙන්න ඇති. නමුත් පොතක් නැවුම් තේමාවක් හරහා යනවා නම් මාව සතුටු කරන්නේ එයයි.

**ආකෘතිය හා ප්‍රස්තුතය අතර මනා සම්බන්ධතාවක් ගොඩනැගීමේදී ඔබ භාවිතා කරන ක්‍රමවේදය කවරක්ද?**

මගේ නවකතාවල සාහිත්‍යමය අංග ඒ විදිහෙන්ම තියෙනවාද කියන්න මම දන්නේ නැහැ. මම ජීවිතය ලියාගෙන යනකොට ඒ හැම අංගයක්ම ඉස්මතු වෙනවා ඇති. නැත්නම් නැතිවෙලා ගිහින් ඇති. මේ දේවල් නිසා මම නවීන ලෝකයට අයත් නැති ලේඛිකාවක් වෙන්න ඇති. නමුත් මම මා ගැන විශ්වාසයක් තබනවා. 'ප්‍රංශ පෙම්වතා පොතේ උපරිම ලක්ෂය ඇවිත් මාලිගේ දියණිය මාලකගෙන් ඔහුට තාත්තා කියා ආමන්ත්‍රණය කරන්නට අවසර ඉල්ලීම යැයි කිහිප දෙනෙක් මට ලියා එවා තිබුණා. නමුත් පොත ලියද්දී මම එතැන එහෙම දෙයක් දැක්කේ නැහැ. අපේක්ෂා කළෙත් නැහැ. පාඨකයින් එය පෙන්වා දෙද්දී මටත් දැනෙන්න ගත්තා ඒ කතාව හරි කියලා. බොහෝ විට මගේ නවකතා කියවන පාඨකයින් මට මගේම කතාව ඔවුන්ට දැනුණු විදිහ කියන විට මම මගේ නවකතාව වෙනත්ම මානයකින් දකින්න ගන්නවා. ලේඛකයෙක් වීම මොන තරම් චමත්කාරජනක දෙයක්ද කියලා හිතෙන්නේ එවිට. පාඨකයින් මගේම පොත මට වෙනත් විදිහකට හඳුන්වලා දෙන විට.



**ඔබෙ පාසල සහ විශ්ව විද්‍යාල ජීවිතයත් දැනට විප්‍රවාසීව ගෙවන ජීවිතයත් ලේඛිකාවක ලෙස ඔබව පෝෂණය කර ඇත්තේ කෙසේද?**

මම උසස් පෙළට ගණිත විෂය හදාරලා මොරටුව විශ්ව විද්‍යාලයෙන් සිවිල් ඉංජිනේරු උපාධිය ලබාගෙන ලංකාවේ සිටි කාලය තුළ ඉංජිනේරුවෙකු ලෙස රැකියාව කළ කෙනෙක්. පසුකාලයක මම විදේශගත වුණා. මේ අත්දැකීම් මාව ලේඛිකාවක ලෙස පෝෂණය කළා තමයි. ඒත් සැබෑ කාරණය ඊට වඩා ඇතුළාන්තරයට ගිය දෙයක්. මම ඉතාමත් සංවේදී කෙනෙක් වීම මගේ ලිවීමට බලපෑවා. ඒ වගේමයි මම හැම මොහොතකම අන් අය තෝරා ගන්නා මාර්ගයේ නෙමෙයි, වෙනත් දුෂ්කර මාවතක යන කෙනෙක්. ඒ වගේමයි කෙනෙක් සිදුවීමක් දකිනවාට වඩා වෙනත් ඇසකින් ඒ සිදුවීම දකින කෙනෙක්. මා මේ දේවල් කියන්නේ මගේ පසුබිම මගේ නිර්මාණ පෝෂණය කරන්නට ඉඩ තියෙන බව වගේම මා සතු ඒ ගතිගුණ ඊට වඩා වැදගත් තැනක් ලිවීම සම්බන්ධයෙන් දරනවා කියන්න. ඔබේ ප්‍රශ්නයට මට නිශ්චිත දෙයක් කිය නොහැකියි. අසම්මතයට බර පිළිතුරක් තමයි මට තියෙන්නේ. පාසල් වියේදී නම් මම උමතුවෙන් වගේ පොත් කියෙව්වා ඉගෙනීමට තිබෙන අකමැත්ත සමබර කර ගන්න උදව්වක් විදිහට. පොතක් එක්ක වෙනත් ලෝකයකට යන හැඟීමේ සුන්දර බව තමයි මගේ මතකයේ තැන්පත් වෙලා ලිවීමට උත්ප්‍රේරණයක් සපයන්න ඇත්තේ. විශ්වවිද්‍යාල ජීවිතය නම් මාව ඒ උමතු කියවීමෙන් ඈත් කළා. නමුත් ඒ කාලය තුළ තමයි මම තේරුම් ගත්තේ ඉංජිනේරු විද්‍යාව හැදෑරුවාට මගේ කැමැත්ත තිබෙන්නේ ආත්මයෙන් පැන නගින යමකට කියලා. ලංකාවෙන් පිටවුණු පසු මගේ පරණ පුරුදු යෙහෙළියන්ගෙන් තොර හුදෙකලා දිවයිනකට වැටුණු නිසා අලුත් වටපිටාවෙන් මිදෙන්නට මම මාර්ගයක් හෙව්වා. එතනදීත් මට ලිවීම හුදෙකලාව නසන ඖෂධයක් වුණා.

**ඔබේ ලිවීමේ අරමුණ කුමක්ද? ඔබ ලියන්නේ කා වෙනුවෙන්ද? කුමක් සඳහාද?**

මම ලියන්නේ මගේ සතුටට. මම තෘප්තිමත් වෙනවා කතාවක් ගොඩ නැගීම තුළ. අව්‍යාජ චරිත ඉපැද්දවීම තුළ. ඒ වගේමයි ඒ චරිත හරහා ගොඩ නැගෙන මිනිස් සබඳතා මොන තරම් බලවත්ද, ඒ සබඳතා මොන තරම් ප්‍රයෝජනවත් යමකට හැරවිය හැකිද කියලා මට ම ඔප්පු කරලා පෙන්වන එක. මම හිතන්නේ නැහැ මම විශේෂිත ලේඛකයෙක් කියා. මගේ නිර්මාණ විශේෂ ඒවා කියා. ඒත් මම ලියන දෙයින් මම තෘප්තිමත්. පොතක් තුළින් මම උපද්දපු ලෝකය පාඨකයාට අත්දකින්න දෙන්න කැමැතියි. කිසිම විටක මට හිතෙන්නේ නැහැ මට මීට වඩා හොඳට ලිවිය හැකියි කියා. මම හිත්නේ මම උපද්දපු කතාවේ චරිත විශ්වසනීයද, විචිත්‍රවත්ද, ඔවුන් ජීවිතය උපරිමයෙන් විඳිනවාද කියන එක. මගේ ලිවීම හරියට මට මාත් එක්කම තියෙන අරගලයක් වගෙයි. හැබැයි ප්‍රකාශකයා ගාවට මගේ අත්පිටපත් යවද්දී මම හුඟක් බැරෑරුම්ව ඉල්ලනවා පොත බාර ගත් යුත්තේ හොඳම තත්ත්වයේ තිබේනම් පමණක් කියලා. මොකද පොත මා වෙනුවෙන් ලියපු එකක් නිසා.

